එකම වරදක් සඳහා කාන්තා හා පිරිමි දෙපාර්ශවයම සහභාගී වූ විටකදී පවා, කාන්තාව පමණක් සෘණාත්මකව ඉස්මතු කර දැක්වීමේ භාවිතාවක් ඇතැම් මාධ්‍ය තුළ දක්නට ලැබේ.

මෙසේ වරදකදී කාන්තාව පමණක් සෘණාත්මකව ඉස්මතු කර දැක්වීම, කාන්තාව ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කොන් කිරීමට ද හේතු නොවන්නේ දැයි පාඨක අප ඇසිය යුතු වේ.

තරුණියකට රට රැකියා යවන බව පවසා වංචාවක් සිදු කළ පුද්ගලයෙකු, පැහැරගෙන ගොස් වධ හිංසා කිරීමේ සිදුවීමක් සම්බන්ධයෙන් දිනමිණ සහ ඩේලි නිව්ස් වාර්තා කර ඇති ආකාරය මෙයට උදාහරණ ලෙස ගත හැක.

ඔබ සිතන ලෙසට,

1) මෙම පුවතේ දැක්වෙන ආකාරයට, මෙම කියවෙන වංචාවට හසු වූ ප්‍රධාන වින්දිතයා වන්නේ අදාළ තරුණිය වේ. නමුත්, සිව් දෙනෙකු හවුල්වී සිදුව ඇති, පුද්ගලයකු පැහැර ගෙන යෑම සහ වද හිංසා කිරීමේ වරද සම්බන්ධයෙන්, එම තරුණිය පමණක් ඉස්මතු කොට වාර්තා කිරීම ගැටලුකාරී නොවන්නේද?

2) එසේ තරුණිය පමණක් ඉස්මතු කොට වාර්තා කිරීමෙන් මාධ්‍ය හඟවන්නට උත්සාහ කරන්නේ සිව් දෙනකු එක්ව සිදු කළ එකම වරදක් සම්බන්ධයෙන් වුවද, වැඩි වගකීම එම තරුණිය වෙත පැවරෙන බව ද?